# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 22 දරන මහනුවර තරුණ බෞද්ධ සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ජූලි මස 12 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 22 දරන මහනුවර තරුණ බෞද්ධ සමිතිය පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 53/69.

## මහනුවර තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"මහනුවර තරුණ බෞද්ධ සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වන රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු කිපය මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථක ව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහාජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 22 දරන මහනුවර තරුණ බෞද්ධ සමිතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසු, මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන එකී මහනුවර තරුණ බෞද්ධ සමිතියේ තත්කාලයෙහි සිටින සභාපති, උපසභාපති හා කළමනාකාර කමිටුව ද එකී මහනුවර තරුණ බෞද්ධ සමිතියේ සාමාජිකයන් ව දැනට සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "මහනුවර තරුණ බෞද්ධ සමිතිය" යන අභිධානය හා නාමය යටතේ අඛණ්ඩ පැවැත්මක් සහිත (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතුය. එය විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන්හි නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද වන්නේය. තවද එකී නාමයෙන් පොදු මුද්‍රාවක් ඇතිව සිටීමේ, පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේය. මහනුවර තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධාගම අධ්‍යයනය කිරීම හා පතුරුවා හැරීම ;

(ආ) ප්‍රායෝගික වශයෙන් බෞද්ධාගම පිළිපැදීම හා බෞද්ධ ප්‍රතිපත්ති අනුව ජීවිත හැඩගස්වා ගැනීමට බෞද්ධයන්ට බෙයවී දීම ;

ඒ 02215—8,950 (73/10)

(ඈ) බෞද්ධයන් අතර සමගිය හා සහයෝගය වැඩි වර්ධනය කිරීම ; සහ

(ඇ) සාමාජිකයන්ගේ ශාරීරික හා සමාජ ශුභ සිද්ධිය වඩාලීම හා බුද්ධි වර්ධනය.

කළමනාකාර කමිටුව.

4. (1) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීති අනුව තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයන් ගණනකින් සමන්විත වන කළමනාකාර කමිටුවක් විසින් සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබේ.

(2) මේ පනත ආරම්භ වන දිනයෙහි ධුර දරන සමිතියේ කළමනාකාර කමිටුව සංස්ථාවේ ප්‍රථම කළමනාකාර කමිටුව වන්නේය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, අස්වීම හෝ නෙරපීම සඳහා ද, කළමනාකාර කමිටුවේ හා විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ යුතුකම් ඉටුකිරීම සඳහා ද, කටයුතු කර ගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පාලනය කිරීම සඳහා හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාද, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී සා වැඩි ඡන්ද යෙන් රීති සෑදීම නීත්‍යනුකූල වන්නේය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමකදී ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම (2) වන උපවගන්තියේ නියමයන්ට යටත් ව කළ හැකි වේ.

(2) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා කිසිදු රීතියක් හෝ මින් මතු සම්මත කර ගනු ලබන කිසිදු රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතුය. එසේ වුව ද එකී වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කළමනාකාර කමිටුව විසින් කලින් අනුමත කරනු ලැබිය යුතුය.

(3) මේ පනත ආරම්භ වන දිනයෙහි බලපවත්නා සංගමයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබේ.

සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට අය විය යුතු ණය.

6. මෙම පනතේ කාර්යයන් සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහිදී පවත්නා සමිතියේ සියලු ණය හා වගකීම් මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සමිතියට අය විය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතුය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.**

7. කළමනාකාර කමිටුවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. එකී සාමාජිකයන් දෙදෙනා පැමිණ සිටිමේ ලකුණක් වශයෙන් එකී ලේඛනයෙහි තම නම අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතුය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

8. යම් මිලට ගැනීමක, ප්‍රදානයක, ත්‍යාගයක, මුදල් බැහැර කිරීමක ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන්නා වූ චංචල හෝ නිශ්චල කවර දේපළක් වුවද භාර ගැනීමටත් සතුව සිටිමටත් නීතිය අනුව සංස්ථාවට හැකියාව ඇත්තේය. තවද විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාව මේ පනතේ කාර්යයන් සඳහා සහ සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව එකී සියලු දේපළ සතුව සිටිය යුතුය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

9. මේ පනතෙහි සඳහන්ව ඇති නම් හැර, ජනරජයේ හෝ යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි අඩංගු කිසිවක් හානිකර නොවන්නේය; නොහොත් බල නොපාන්නේය.